ලක්බිම

සිළුමිණ ලක්බිම නිව්ස් පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම.

කර්තෘ මණ්ඩලය
445/1, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14.
දුරකථන : 011 2426000
ෆැක්ස් : 011 2441899, 011 2441897
ඊමේල් : daily@lakbima.lk

බෙදාහැරීම් අංශය
445/1, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14.
දුරකථන : 011 2426016, 0714 4614003,
ෆැක්ස් : 011 2395484
ඊමේල් : circulation@lakbima.lk

'ලක්බිම' දැන්වීම් අංශය
සුමති කෝට් 491, ගාලුපාර, කොළඹ -03
දුරකථන : 2597315, 4-521955/521954/521912
ෆැක්ස් : 4518313

කොටුව ශාඛාව - දැන්වීම්
අංක 12, ශ්‍රීමත් විත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ-02 (රීගල් සිනමාහල අසල)
දුරකථන : 011 2439466 / ෆැක්ස් : 011 2439467
ඊමේල් : cityoffice@lakbim.lk

මහනුවර ශාඛාව - දැන්වීම්
35 18/2, නයිමා වෙලෙඳ සංකීර්ණය
කොටුගොඩැල්ල විදිය, මහනුවර
දුරකථන : 081 2215429
ෆැක්ස් : 081 2215429

මැතිවරණ අපේක්ෂකයින්ට නීති පැනවීමේ වැදගත්කම

ජනාධිපතිවරණයෙන් පසු බිහි වූ ජාතික ආණ්ඩුවේ පොරොන්දු වූ දින සියයේ කාලය අවසන් වූ පසු දැන් රටේ යළි දේශපාලන කතාබහක් මතුවී ඇත්තේ නැවතත් මහ මැතිවරණයකට යෑම පිළිබඳවයි. වත්මන් පාර්ලිමේන්තුවට 2016 අප්‍රේල් වනතුරුම ආයුෂ තිබුණත් ඊට මත්තෙන් එය විසුරුවා හැරීමට වැඩි ඉඩකඩක් තිබේ. එවිට එළැඹෙන්නේ මහ මැතිවරණයකි. පළාත් පාලන ආයතන බොහොමයක නිල කාලයද මේ වනවිට අවසන් වී ඇති බැවින් ඒවාටද නුදුරේදීම මැතිවරණ පැවැත්විය යුතුව ඇත. ජන්ද අපේක්ෂකයින් කල එළි බසින කාලයක් අනාගතයේදී යළි උදාවනු ඇත්තේ මේ නිසාය.

මැතිවරණයකට තරග වදින අපේක්ෂකයින්ගේ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම පිළිබඳවත් ඔවුන්ගේ අතීත හැසිරීම රටාව හා වත්මන් කල් ක්‍රියාව පිළිබඳවත් විශේෂ උනන්දුවක් ප්‍රබුද්ධ හා සවිඤ්ඤාණක ජන කොටස් අතර මෑත කාලීනව ඇති වන්නට විය. ඒ එම අපේක්ෂකයින් ජන්දයෙන් ජයගෙන මහජන නියෝජිතයින් බවට පත්වූ පසුව සිදුකරනු ලබන විවිධ නොපණෙන්කම් හා නොසඟ්ධාලකම සමාජයේ පිළිකුල දනවන තරමට මෑත ඉතිහාසයේදී දරුණු තත්ත්වයකට පත්වූ අවස්ථා තිබූ බැවිනි. නොයෙකුත් ප්‍රචණ්ඩ ක්‍රියා සමාජ විරෝධී කටයුතු හා දූෂණ වංචා සිදුකරන පහත් මානුෂිකත්වයකට මහජන නියෝජිතයින් පත්වූ අවස්ථා එමට තිබිණි. මේ නිසා ඔවුන්ට අදාළ වන හැසිරීම් ආචාර ධර්ම පද්ධතියක් ඇතිකළ යුතු බවට කතිකාවතක් සමාජය තුළ හට ගැනුණේ කලකට පෙරය. නමුත් ඒ ගැන කයිවාරු ගැහුවා විනා එය යථාර්ථයක් කිරීමට මෑතක් වනතුරුම කිසිවකුත් ඉදිරිපත් වූයේ නැත.

ඉකුත් දශක දෙකක කාලය පුරාවට මෙරට ජාතික මැතිවරණ නිරීක්ෂක ජාලයක් ලෙසින් ක්‍රියාත්මක වූ පැෆරල් සංවිධානය මේ වෙනුවෙන් ඉදිරිපත් වන්නේ එවැනි පසුබිමකය. ඔවුන්ගේ එම සක්‍රිය මැදිහත් වීම වූ කලී ප්‍රමුඛ සමාජ අවශ්‍යතාවයක් ඉටු කිරීමකි. ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන සියලු දෙනාගේ ඇගයීමට එය ලක්විය යුතු වන්නේ එබැවිනි. "නාම යෝජනා ලබාදීමේදී දේශපාලන පක්ෂ සලකා බැලිය යුතු මූලික නිර්ණායක යෝජනාවලිය" යන ශීර්ෂ පාඨය යටතේ කෙටුම්පත් කරනු ලැබූ එම ලියැවිල්ලෙහි වැදගත් කරුණු 08ක් සම්පිණ්ඩනය කර දක්වා ඇත. කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී දේශපාලන පක්ෂවල නායකයින් විසින් ඊට අත්සන් තබා මෙය එළි දක්වනු ලැබුවේ පසුගිය මාර්තු මාසයේ 12 වැනිදාය.

මාර්තු 12 ප්‍රකාශනය

එබැවින් මෙයට "මාර්තු 12 ප්‍රකාශනය" යන නම පටබැඳී තිබේ.

මෙරට ප්‍රධාන දේශපාලන පක්ෂ සියල්ලේම පාහේ නායකයින් මෙම ප්‍රකාශනයට අත්සන් තබා තිබීම විශේෂත්වයකි. එමගින් එහි ඇතුළත් කරුණු ඔවුන් ප්‍රකාශිතවම පිළිගෙන තිබේ.

"මාර්තු 12 ප්‍රකාශනයේ" අන්තර්ගත වන්නේ ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ සිවිල් අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා නීරණාත්මක වශයෙන් බලපාන මූලික හරයාත්මක කාරණාවන් 08කි. මේවා අදාළ වන්නේ පක්ෂවලින් පුද්ගලයින්ට මැතිවරණයට නාම යෝජනා ලබාදීමෙදීය.

01. අපරාධ වරදක් සඳහා සිර දඬුවමට ලක්වූ හෝ අන්තිවුවූ සිර දඬුවම්වලට ලක් වූවෙකු නොවිය යුතුය.

02. අල්ලස් හෝ දූෂණ පිළිබඳ වරදකරුවකු නොවූ සමාජය පිළිගත් චරිතවත් අයකු විය යුතුයි. එමෙන්ම අල්ලස් හෝ දූෂණ පිළිබඳ චෝදනා ලැබූ අය ගැන පරීක්ෂාකාරී විය යුතුයි.

03. මධ්‍යසාර, මත්ද්‍රව්‍ය, සූදු, කැසිනෝ, ගණිකා මඩම් ඇතුළු රටේ පැවැත්මට හානිකර ව්‍යාපාර පවත්වාගෙන යන අය හෝ අතීතයේ එසේ නොකළ අයකු විය යුතුයි.

04. ජීව ආධාරක වෘහය විනාශ කරන පාරිසරික වශයෙන් හානිදායක වන ව්‍යාපාරවල යෙදුණු හෝ යෙදෙන අයකු නොවිය යුතුයි.

05. දේශපාලන බලය අනිසි ලෙස සහ අයුතු ලෙස භාවිතා නොකළ අයකු විය යුතුයි.

06. මහජන නියෝජිතයකු වන්නට පෙර රටට අහනිගාමී මූලෝමය ගිවිසුම් ඇතිකරගත් සහ මහජන නියෝජිතයකුව සිටිමින් තම දේශපාලන බලය අයුතු ලෙස භාවිතා කර රජය සමග මූලෝමය ගිවිසුම් ඇති කරගත් හෝ ගිවිසුමක පාර්ශ්වකරුවකු නොවන්නකු විය යුතුයි.

07. නාම යෝජනා ලබාදෙන අපේක්ෂ

කයා තමා නියෝජනය කරන ප්‍රදේශයේ පදිංචිකරුවකු හෝ එම ජනතාව සමග සම්බන්ධතා පවත්වන අයකු විය යුතුයි.

08. නාම යෝජනා ලබාදීමෙදී කාන්තා සහ තරුණ නියෝජනය සඳහා ප්‍රමාණවත් අවස්ථා ලබාදීමට ක්‍රියා කළ යුතුයි.

මේ කාරණා සියල්ල බැලූ බැල්මට රටට ඉතාම වැදගත් යෝජනා වේ. නිසි ලෙස ක්‍රියාවට නැගිය හැකි වුවහොත් සමාජ සාධාරණත්වය හා සමාජ යුක්තිය ඉෂ්ට කිරීම සඳහා මෙවා අතිශය ප්‍රබල කාරණාවන්ය. අද අපේ සමාජයේ වැඩියෙන්ම දොඩවන යහපාලනයේ මූලික අඩිතාලම වැටී ඇත්තේද මෙම සංවේදී සමාජ නිර්ණායක මතය. එබැවින් මෙම ප්‍රකාශනයට දේශපාලන පක්ෂ නායකයින් ලවා මේ වකවානුවේදීම අත්සන් ලබා ගැනීමෙන් පැෆරල් සංවිධානයද ඉටුකර ඇත්තේ කාලීන යුග මෙහෙවරකි.

ජනතා වරමින් පත්වන මහජන නියෝජිතයකු සිය තනතුරට නොගැළපෙන නොමනා ක්‍රියාවක් කළහොත් ජනතාව විසින්ම ඔහු එම තනතුරින් ආපසු කැඳවිය හැකි පුනරාවර්තනය (Call Back) වැනි අතිශය දියුණු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම ස්විට්සර්ලන්තය ආදී පරිණත යුරෝපා සමාජයන්හි දැක ගත හැකිය. එහෙත් අවාසනාවකට ශ්‍රී ලංකාව, ඉන්දියාව වැනි දකුණු ආසියානික සමාජයන් හි එවැනි ක්‍රම දක්නට නොමැත. මේ සමාජයන් හි දේශපාලකයින්ට එළිපිටම සමාජ විරෝධී දූෂණ කටයුතුවල යෙදීමට තරම් හිරිඔතප් නැතිවී ඇත්තේද එම නිසා විය හැකිය. අපේ රටේ වුව මහජන නියෝජිතයකු විසින් ඔහු ජන්ද අපේක්ෂකයකුව සිටියදී හෝ එම තනතුරට පත්වූ පසුව සිය ධුරයේ නාමයෙන් හෝ කරනු ලැබූ බලවත් විෂමාචාරයක් මත ඔහුගේ මන්ත්‍රී ධුරය අහෝසි කළ හැකි තත්ත්වයක් පැරණි ජන්ද ක්‍රමය යටතේ පැවැතිණි. ඒ එවැනි වූදිත මහජන නියෝජිතයකුට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන ජන්ද පෙත්සමක් මත අධිකරණයක් මගින් ඔහුව වරදකරු බවට පත්කර ඔහුගේ මන්ත්‍රී ධුරය අහෝසි කිරීම ඔස්සේය. මේ ක්‍රමයට චෝදනා ලත් මහජන නියෝජිතයින් තනතුරින් පහ කරනු ලැබූ අවස්ථා එකල ඕනෑ තරම් තිබිණි. ජනතා නියෝජිතයින් එදා වැරදි කිරීමට බිය වූයේ ඒ නිසාය. එහෙත් සමානුපාතික ජන්ද ක්‍රමය තුළ නියෝජිතයා අහිබවා පක්ෂයේ වැදගත්කම ඉස්මතු වී පෙනෙන්නට වීමත් සමග පැරණි ජන්ද පෙත්සම් ක්‍රමයද වර්තමානය වනවිට සහමුලින්ම අතුරුදන් වී ඇත. ජනතා නියෝජිතයින් කිසිදු බියක් සැකක් නොමැතිව තම බලයේ සීමාව ඉක්මවා යමින් එළිපිටම වැරදි කිරීමට අද පෙළැඹී සිටින්නේද මේ නිසාය.

තමන් විසින් පත් කරනු ලැබූ මහජන නියෝජිතයකුගේ බලවත් සමාජ විමොචාරයක් මත ඔහුව එම තනතුරින් නෙරපා හැරීම සඳහා මැදිහත් වීමේ හැකියාව මේ අනුව ලාංකීය පුරවැසියන්ට නොමැත. එවැනි අවස්ථාවකදී ඔහුට විරුද්ධව කටයුතු කර දඬුවම් පැමිණ වීමට තම නීතියේ පිළිසරණ පැතීමට අනිවාර්යයෙන්ම සිදුවේ. එහෙත් එවැනි අවස්ථාවකදී වුව ඇතිවිය හැකි අනවශ්‍ය දේශපාලන බලපෑම් හා මැදිහත්වීම් හේතුවෙන් පූර්ණ ලෙස යුක්තිය ඉටුවන්නේ නැත. හිනාමතාම වරද කොට නීතියේ සිදුරුවලින් අපූරුවට රිංගා යාමේ පිළිවෙළ මේ කෙරොටික දේශපාලකයෝ කදිමට දනිති. එකම වරද යළි යළිත් කිරීමට මෙන්ම පියවරෙන් පියවර වඩාත් බරපතළ ගණයේ විශාල අපරාධ කිරීමටද කිසිදු චකිතයකින් තොරව ඔවුන් පෙළැඹෙන්නේ එම නිසාය.

එසේ විනැයි කියා ඔහුගේ වරදට දඬුවම් දීමේ හැකියාවක්ද සමාජයට නොමැත. ඒ වෙනුවෙන් ව්‍යවස්ථාදායකයේ කාලය හමාර වී යළි ජන්දයක් එළැඹෙන තුරු බොහෝ කාලයක් බලා හිඳීමට පොදු මහජනතාවට සිදුවේ. මෙය වූ කලී වැරදි ක්‍රියාමාර්ගවලින් තම සුබ විහරණය සලසා ගැනීමට මාන බලමින් සිටින අවස්ථාවාදී දේශපාලුවන්ට නම් පනින රිලවුන්ට ඉනිමං තැබුවාක් වැනිය.

වත්මන් දේශපාලන සමාජය මේ තරමට පිරිහී ඇත්තේද ඒ තුළ දූෂණය ඉහවහා ගොස් ඇත්තේද මහජන සේවයට නොගැළපෙන නුසුදුසු පුද්ගලයින් ඊට පත්ව තිබීම නිසාවෙනි. පවත්නා දූෂිත ජන්ද ක්‍රමය තුළ යහමින් සල්ලි එහා මෙහා විසි කරමින් සැබෑ ජනතා කැමැත්ත යටපත් කර ජන්දය අනියමින් කොල්ල කා ගෙන මැතිසබයට හෝ පුරසබයට තේරී පත්වීමේ හැකියාව මොවුන්ට ලැබී ඇත්තේ ඊනියා මනාප ක්‍රමවේදයට පින්සිදු වන්නටය. මෙවැනි තත්ත්වයක් තුළ අපේක්ෂකයාගේ නිල බලය, ධන බලය හා මැර බලය හමුවේ විපිලිසර වන ජන්ද්දායකයා මැතිවරණයේදී කිසිවක් කර කියාගත නොහැකි අසරණ තත්ත්වයකට පත්වේ.

මැතිවරණ ක්‍රමයේ බාහිර ස්වරූපය හා ක්‍රියාකාරීත්වය අනුවම එය හොරුන්ට, මැරයන්ට, දූෂිතයින්ට හා තක්කඩීන්ට උඩගෙඩි දෙන්නක් වන්නේ නම් ඊට එරෙහිව උඩුගං බලා පිහිනා ගොස් රටට හිතැති ජනතාවට සමීප පාලකයින් පිරිසක් පත්කර ගත හැකි වනු ඇත්තේ ඊට සුදුසු ආදර්ශවත් චරිතවත් හා සද්ගුණවත් පිරිසකට ජන්ද අපේක්ෂකත්වය ලැබෙන්නේ නම් පමණි. එහෙත් අද එවැන්නක් සිදු නොවන්නේ දේශපාලන පක්ෂවල නායකත්වය පවා දැඩි දූෂිතයින්ගේ බලපෑම්වලට ගැනී වී වහල් වී නන්නත්තාර වී සිටින නිසාය. මේ තත්ත්වයෙන් මිදීමට නම් පක්ෂ යාන්ත්‍රණයේ ඉහළ සිට පහළ දක්වා සෑම ස්ථාවරයක්ම දැඩි ආකල්පමය වෙනසකට ලක් කළ යුතුය. "මාර්තු 12 ප්‍රකාශනයේ" ඇතුළත් කරුණු වැදගත් වන්නේ ඒ සඳහා වන කදිම මාර්ගෝපදේශනයක් එමගින් ඉහළ දේශපාලන පක්ෂ නායකත්වයට සපයනු ලබන නිසාවෙනි. දැනට ජරාජීර්ණ වී දිනෙන් දිනම පරිහානිය කරා යමින් තිබෙන රටේ දේශපාලනය යළි පිරිසිදු කොට යහමගට ගත හැකි වන්නේ ඊට සුදුසු පවිත්‍ර හා පරමාදර්ශී පරපුරක් එහි අනාගතය භාරගත හොත් පමණි. රටේ උගත් බුද්ධිමත් වැදගත් මහත්වරුන් එදා මෙන් අද දේශපාලනයට නොඑන්නේ මැරයන්ගේ වණ්ඩිකම්වලට සාර්ථකව මුහුණදීමට තරම් ඔවුන් ඔරොත්තු නොදෙන නිසාය. කලියුග දේශපාලනය තුළ බුද්ධි බලය අභිබවා ජයගන්නේ මුග්ධ බලය බව පෙන්විය හැකි අපමණ උදාහරණ අපගේ මෑත කාලීන දේශපාලන ඉතිහාසය තුළින් පහසුවෙන් සොයාගත හැකිය. එසේ වන්නේද ජනතා සේවයේ යෙදීමට තරම් නොවන පිරිහුණු පහත් පුද්ගලයින්ට ජන්ද අපේක්ෂකත්වය ලැබීම හේතුවෙනි. ඔවුන්ට නාම යෝජනා ලබාදීමෙන් ඒ වරද සිදු කරන්නේද දේශපාලන පක්ෂ වල ඉහළ නායකත්වය විසින්මය. නමුත් එය ප්‍රබුද්ධ හා සංවේදී සමාජ කොටස්වල දැඩි විරෝධයටත් විවේචනයටත් නිරන්තරයෙන්ම ලක්වේ. මේ පසුබිම තුළ "මාර්තු 12 ප්‍රකාශනයේ" ඇතුළත් කරුණු වැදගත් වන්නේ තමන්ගේ මෙතෙක් කෙරුවාව ගැන ආපසු හැරී බලා ස්වයං විවේචනාත්මක ඇගයීමක යෙදීමට එමගින් පක්ෂ නායකයින් පොළඹවන සුලු නිසාය.

මෙම ප්‍රකාශනයේ අඩංගු කාරණා පුළුල් සමාජ සංවාදයකට බඳුන් වී ඊට පොදු පිළිගැනීමක් ලැබුණහොත් එය අනාගත යහපාලනයක යෝධ පිම්මක් වනු ඇත. එවැනි කලෙක ජන්ද අපේක්ෂකයින් වී මැතිවරණයකදී ජන්ද දායකයා අභියසට පැමිණෙනු ඇත්තේ මහජන සේවයට සැබැවින්ම සුදුසු අවංක පිරිසිදු හා ආදර්ශමත් දේශපාලනඥයින් පිරිසකි. එවැනි කෘතඥතා ප්‍රවණයින් අතරෙහි එකිනෙකා ගහ මරා ගන්නා 'මනාප බලු පොර' හට නොගනු ඇත. එහිදී සිදුවනු ඇත්තේ අදට වඩා බෙහෙවින් උසස් මට්ටමේ මනා ශික්ෂණයකින් යුතු ඉතාමත් ආචාරශීලී ජන්ද ව්‍යාපාරයකි. එය අද මෙන් ජන්ද දායකයාගේ තාර්කික බුද්ධියට නිගරු කරන අන්දමේ පහත් දේශපාලන ව්‍යාපාරයක් වන්නේ නැත. මේ නිසාම හරි වැරැද්ද නිවැරදිව වටහාගෙන එම නිවැරදි දේ අතුරින්ද වඩාත්ම හොඳ දේ කුමක්දැයි සිය හෘදය සාක්ෂියට එකඟව

යහපාලනයට යෝධ පිම්මක්

නිදහසේ තීරණය කිරීමේ හැකියාව ජන්ද දායකයාට ලැබෙනු ඇත. එවැනි පසුබිමක් තුළ හොඳම පෙරහන්කඩක් බවට පත්වන මැතිවරණයෙන් ජයගෙන තේරී එනු ඇත්තේද තරග කරනු ලැබූ පිරිස අතරෙහි සිටි හොඳම අපේක්ෂකයින් කිහිප දෙනායි. ජන්දයකදී මෙවැනි පිවිතුරු ප්‍රතිඵලයක් සමාජයට ලබාගත හැකි වන්නේ ඊට ඉදිරිපත් කරනු ලැබූ පිරිසද පරම පිවිතුරු සමාජ කණ්ඩායමක් වන්නේ නම් පමණි. ජාතික දේශපාලන සන්දර්භය තුළ එම පිවිතුරු බව ගොඩනැංවීමේ මූලික වගකීම පැවරී ඇත්තේද පක්ෂ නායකයින්ගේ දෙවුර මතය.

"මාර්තු 12 ප්‍රකාශනයේ" යෝජනා එලෙසම ක්‍රියාත්මක වුවහොත් අපරාධ වැරදි සඳහා අධිකරණයෙන් දඬුවම් ලැබූ පුද්ගලයින්ටද, අල්ලස් දූෂණය පිළිබඳව වැරදිකරුවන් වී සිටින පුද්ගලයින්ට හා මත්ද්‍රව්‍ය ජාවාරම්, කැසිනෝ, සමාජ විෂමාචාර ආදිය ගැන චෝදනා ලබා සිටින පුද්ගලයින්ටද ඉදිරි මැතිවරණයක් වෙනුවෙන් තරග කිරීමට නාම යෝජනා නොලැබෙනු ඇත. මේ ගණයේ චෝදනාවන්ට ලක්වූ පුද්ගලයින් රැසක් පක්ෂ විපක්ෂ දෙකෙහිම පාර්ලිමේන්තු පළාත් සභා හා පළාත් පාලන නියෝජිතයින් අතරෙහි මේ වනවිට සිටින බව කියවේ. පෙර කිසිදා නොවූ තරම් බරපතළ ලෙස රටේ දේශපාලනය අද වනවිට පරිහානිය කරා ගොස් තිබෙන්නේ එහි ප්‍රතිඵලයක් ලෙසය. නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී පාලන පිළිවෙත කෙරෙහි මහජන විශ්වාසය තවදුරටත් රඳවා ගැනීමට නම් මේ පරිහානියට අනිවාර්යයෙන්ම නැවතිමේ තිත තැබිය යුතුමය. එය කළ හැකි වන්නේ වඩාත් විශ්වසනීය නොකිළිටි පුද්ගලයින් පිරිසකට රටේ දේශපාලන නායකත්වය භාරගැනීමට ඉඩ සැලසීමෙන්ය. මාර්තු 12 ප්‍රකාශනය මෙහිලා වැදගත් වන්නේ ඒ සඳහා වන කදිම ආරම්භක ප්‍රවේශයක් එහි සඳහන් කරුණු ඔස්සේ ලබාගත හැකිවන නිසාය.

රටේ අනාගතය භාරගැනීමට සූදානමින් සිටින තරුණ පරම්පරාවට දේශපාලන කටයුතුවලට ප්‍රවිෂ්ට වීම සඳහා වැඩි අවස්ථාවක් සලසා දීම සමාජයේ මූලික වගකීමකි. යොවුන් පරපුරේ සිතුම් පැතුම් ඉටුවී අසහනයෙන් මිදුණු තරුණ සමාජයක් රට තුළ බිහිවන්නේ ඔවුන්ගේ සැබෑ මතය හා අවශ්‍යතාවය ජාතික දේශපාලන වේදිකාව තුළ නියෝජනය වන විටදීය. රටේ බහුතරයක් වන කාන්තාවන්ගේ හදගැස්ම හඳුනාගෙන ඔවුන්ට වඩාත් සමීප වීමට නම් ක්‍රියාකාරී දේශපාලන වෘහය තුළ ස්ත්‍රීන්ට අද හිමිවී තිබෙන අවම ලංසුව අනාගතයේදී නියත වශයෙන්ම ඉහළ නැංවිය යුතුය. ප්‍රචණ්ඩත්වයෙන් හා හිංසනයෙන් තොර සාමකාමී දේශපාලන රටාවක් ගොඩනැංවීමෙහිලා වැඩි කාන්තා සහභාගීත්වය ප්‍රබල සාධකයක් වනු නිසැකය. ගමෙන් ජන්දය ගෙන ගමත් ගැමියාත් අත්හැර සිදාදියට ගොස් දේශපාලන ව්‍යාපාර කටයුතු කරන දුරස්ථ නායකයින් වෙනුවට ගමේ ජනතාව සමග එකට ජීවත් වෙමින් ඔවුන් හා එක්ව දේශපාලනය කරන සමීප ප්‍රාදේශීය නායකයින් පාලන තන්ත්‍රය තුළ බිහිකර ගැනීම වැදගත් වේ.

නීතිඥ කපිල මුණසිංහ

අපරාධ සංස්කෘතියට සදහටම තිත තබමු

ලකෙට ඉහත රටපුරා සුදුවැන් උවදුරක් පැතිර තිබුණේය. එමගින් සිදුවූයේ ආණ්ඩුවේ සහ ප්‍රදේශයේ දේශපාලන බලවතුන්ට රිස්සුම් නොදෙන වැඩ කළ පුද්ගලයන් සුදු වැන් වලින් පැමිණි නාඳුනන පුද්ගලයන් විසින් පැහැරගෙන යාමය. එලෙස පැහැර ගෙන ගිය වැඩි දෙනෙක් අතුරුදහන් වූහ. මාධ්‍යවේදියකු වූ ප්‍රගීත් එක්නැලිගොඩ එයින් එක් කෙනෙකි. නවත් අය පසුව නමුවූයේ නිසට වෙඩි නබා ඝාතනය කර තිබූ මළ සිරුරු වශයෙනි.

ඊටත් අමතරව රජයේ ලොකු ලොක්කන්ගේ උදහසට ලක්වූ නවන් පිරිසකට සිදුවූයේ මහ දවල් නාඳුනන නුවක්කු කරුවන්ගේ අනුකම්පා විරහිත වෙඩි උණ්ඩයට බිලිවීමටය. සන්ඩේ ලීඩර් පත්‍රයේ කතුවරයා වූ ලසන්ත වික්‍රමතුංග ඵලෙස ඝාතනය කෙරුණු එක් අයකු වූ අතර ඔහුගේ ඝාතනය නවමත් පවතින්නේ නොවිසඳුණු අභිරහසක් වශයෙනි.

වසර ආරම්භයේ පැවැති ජනාධිපතිවරණයේ ජයග්‍රහණය තීන්දු කෙරෙන නීරණාත්මක සාධකයක් වූයේද එවකට විටින් විට අසන්නට ලැබුණු සුදුවැන් උවදුර පිටු දැකීමයි. තමන්ගේ ආණ්ඩුවක් යටතේ මුල්වරට හඳුන්වා දෙනු ලබන යහපාලනය තුළ සුදුවැන් උවදුර හා නාඳුනන නුවක්කුකරුවන් සහමුලින්ම නුරන් කරන බවට ප්‍රතිඥා දුන් විපක්ෂයේ පොදු අපේක්ෂක මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ජයග්‍රහණයට මූල්වූ එක් හේතුවක් වූවේ ද එම සුදු වැන් උවදුර පිටු දැකීමයි.

ඒ අනුව ඉකුත් ජනාධිපතිවරණයෙන් මෛත්‍රීපාල සිරිසේන මහතා අති විශිෂ්ට ජයග්‍රහණයක නිමිකර ගනිද්දී සුදුවැන් උවදුරෙන් හෙම්බත් වී සිටි ජනතාව සැනසුම් සුසුම් හෙළුවාට සැක නැත. එසේම එදා මෙදා කාලය තුළ සුදු වැන්වලින් පැමිණ සිදුකරන ලද පැහැර ගැනීමක් හෝ නාඳුනන නුවක්කුකරුවන් විසින් කරන ලදැයි කියන මනුෂ්‍ය ඝාතනයක් ගැන හෝ අසන්නට නොලැබීමද සැනසිලිදායක තත්ත්වයකි.

එසේ වුවද මේ වන විට රටේ විවිධ පෙදෙස්වල සිදුවෙමින් පවතින ඝාතන රැල්ලක් පිළිබඳව අසන්නට ලැබේ. යාපනයේ කයිට්ස් ප්‍රදේශයේ සිවලෝගනාදන් විද්‍යා නමැති පාසල් සිසුවිය අමානුෂික ලෙස සමූහ දූෂණයකට ලක් කර ඝාතනය කිරීම ඒ අතරින් එක් සිද්ධියකි. පිළියන්දල මධ්‍යම ප්‍රදේශයේ නිවසකින් පැහැර ගන්නා ලදුව පහර දී මුළුමහත් ඝාතනය කෙරුණු පුද්ගලයෙකු ගේ මළ සිරුරක් වැන් රියකින් ගෙන යමින් තිබියදී අතුරුගිරිය පොලිසිය විසින් අත්අඩංගුවට ගැනීම එවන් තවත් සිද්ධියකි. මේ අතර කොටකෙනන ප්‍රදේශයේ සිදුවූ තවත් කාන්තාවකගේ ඝාතනයක් ගැනද ඉකුත් මාසයේ දී අසන්නට ලැබුණේය. එමෙන්ම මිනිස් සිරුරු දෙකක අතපය කොළඹ ඇළවල් වලදී හමුවිය.

ඒ හැම සිද්ධියක්ම පෞද්ගලික හේතු සාධක මත සිදුකෙරුණු මනුෂ්‍ය ඝාතන විය හැකිය. එසේම ඒවාට පෙර මෙන් දේශපාලන බලපෑමක් හෝ නාඳුනන නුවක්කුකරුවන් ගේ සම්බන්ධයක් නොමැති වීමටද පුළුවන. එහෙත් ප්‍රශ්නය වන්නේ එවැනි බිහිසුණු මනුෂ්‍ය ඝාතන ගැන අසන ජනතාව එම නිසා දැඩි කම්පනයකට පත්වීමයි. එමෙන්ම විදෙස් ගනුදු පාතාලයන් ද යළි මෙරටට පැමිණ ඇතැයි වාර්තා විය. ජනතාව එලෙස කම්පනයට පත්වන්නේ කලකට ඉහත රටපුරා පැවැති සුදුවැන් උවදුර සහ නාඳුනන නුවක්කු කරුවන් පිළිබඳ අප්‍රසන්න මතකයන් ඔවුන්ගේ සිත් සතන් තුළ නවමත් රැඳී තිබෙන බැවිනි. මෙම නව ප්‍රවණතාවය කොහෙන්ම අනුමත කළ නොහැකිය.

ජනතාව තුළ පවතින මෙවැනි සැකමුසු හැඟීම් දුරුකරලීම පාලක පක්ෂයේ වගකීමකි. එසේම එය කළ යුත්තේ පොලිසිය කාර්යක්ෂම නත්ත්වයට පත් කිරීමෙන් බව නොරහසකි. වත්මන් පොලීසිය අකාර්යක්ෂම යැයි එමගින් අදහස් නොකෙරේ. එසේ වුවද කයිට්ස් නිසිව ලෝගනාදන් විද්‍යා සිසුවියගේ ඝාතනයට සම්බන්ධ සැකකරුවන් අත් අඩංගුවට ගැනීමේදී පොලීසිය අතින් යම් අපහසුවීමක් හෝ උනන්දු නොවීමක් සිදුවී ඇති බවට දැනටමත් නොරතුරු ලැබී තිබේ.

එම ප්‍රදේශයේ උසස් පොලිස් නිලධාරීන් කීප දෙනෙකුටම පොලිස්පතිවරයා විසින් ස්ථාන මාරුවීම් ලබාදීමෙන්ම ඒ බව නහවුරුවේ. එය සතෘයක් නම් එවැනි දෑ දිගටම සිදුවීම වහාම වැළැක්විය යුතුය. මන්ද ආණ්ඩුවේ යහපාලන පැවැත්මට එවැනි සිදුවීම් නිසා බලවත් අවමානයක් සිදු වන බැවිනි. ජනාධිපතිවරයාට හෝ අග්‍රාමාත්‍යවරයාට රටේ ජනතාව ආරක්ෂා කිරීමට නොහැකි බව සැබෑය. ඔවුන් එය කළ යුතු වන්නේ පොලීසිය හරහා රටේ නීතිය නීති ලෙස ක්‍රියාන්මක කරවීමෙනි.

එහිදී පොලීසිය අතින් යම් අඩුපාඩුවක් හෝ අනපසුවීමක් සිදුවුවහොත් එහි වගකීම පැවරෙන්නේ ආණ්ඩුවටය. පසුගිය ආණ්ඩුව සමයේ පැනිරුණු සුදු වැන් උවදුර සහ නාඳුනන නුවක්කුකරුවන් පිළිබඳ ප්‍රශ්නය එතරම් බරපතළ නත්ත්වයකට පත්වූයේ එවකට පැවැති ආණ්ඩුව එවැනි අවස්ථාවලදී දක්වන ද කුසීනකම නිසා බව නොරහසකි. එහෙයින් මෙවැනි දෑ මූල්කරගෙන අතීත සිදුවීම් ප්‍රතිරූපණය වීමට ඉඩ නොතැබීම වත්මන් යහපාලන ආණ්ඩුව සතු බලවත් වගකීමකි.